රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2026

මගේ අංකය : EST-1/CIRL/03/0001-(I)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2026.04.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>තොරතුරු තාක්ෂණ මෙවලම් දෛනික රාජකාරී සඳහා ප්‍රයෝජනයට ගැනීම</u>**

සේවාලාභීන් ලෙස මහජනතාව රජයේ සේවය ලබාගැනීමේ දී සහ සේවාදායකයින් ලෙස රජයේ නිලධරයන් රජයේ සේවය සැපයීමේ දී මුහුණදෙන බොහොමයක් ගැටලු සඳහා තොරතුරු තාක්ෂණ මෙවලම් භාවිතය ඉතා ප්‍රශස්ත විසඳුමකි.

02. ඵලදායී සහ නිසි කාල කළමනාකරණයක් සහිත රාජ්‍ය සේවයක් පවත්වාගෙන යාම සඳහා උපයෝගීකොට ගතහැකි තොරතුරු තාක්ෂණ මෙවලම් සහ එම මෙවලම් භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව සරල පැහැදිලි කිරීමක් සහිත උපදෙස් මාලාවක් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කර ඇත.

03. තොරතුරු තාක්ෂණ මෙවලම් සහ එම මෙවලම් භාවිතය පිළිබඳව සරල උපදෙස් ඇතුළත් උපදෙස් මාලාව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන https://mode.gov.lk හි බාගතකිරීම් යටතේ ප්‍රකාශයට පත්කර ඇති අතර පහත දිගු ඔස්සේ අදාළ උපදෙස් මාලාව බාගත කරගත හැක.

සිංහල - https://mode.gov.lk/si/guidelines/Docs/modeigsin.pdf

දෙමළ - https://mode.gov.lk/ta/guidelines/Docs/modeigtam.pdf

ඉංග්‍රීසි - https://mode.gov.lk/guidelines/Docs/modeigeng.pdf

04. ඉහත තොරතුරු තාක්ෂණ මෙවලම් සහ එම මෙවලම් භාවිතය පිළිබඳ උපදෙස් මාලාව පිළිබඳව ඔබ යටතේ සිටින සියලු ආයතන ප්‍රධානීන් දැනුම්වත් කර අදාළවන පරිදි ඔවුනගේ දෛනික රාජකාරි සඳහා මෙම තොරතුරු තාක්ෂණ මෙවලම් භාවිතා කිරීම දිරිගැන්වීමට ක්‍රියා කරන මෙන් දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ade-i@pubad.gov.lk